පූජ්‍ය ඇත්කඳුරේ සුමනසාර හිමි

සංස්කෘත අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*Paper: Diversity*

# විශ්මිත ප්‍රාඥයින් ලොව පහළ කරවන ගුරු - බුධ සුසංයෝගය

විශ්මිත විශ්වයේ ක්‍රියාකාරිත්ත්වය අතිශයින්ම විසිතුරුය. එහි පැවැත්ම හා නැවැත්ම හඳුනාගැනීම සුකර නොවේ. මෙවන් වූ විශ්වයක පහළවන සත්ත්වයෝ එහි ක්‍රියාකාරිත්වයට ඇතැම්විට අනුගත වන අතර තවත් විටෙක ප්‍රතිපක්ෂ වෙති. එසේම ඔවිහූ විශ්වයේ අපූරු නිර්මාණයන්ගෙන් මවිතව ජීවිතයට ඒවායෙහි බලපෑම කවරාකාර ද යන්න විමර්ශනය කළ හ. මෙපරිදි මිනිසාට තෙවන ඇසක් හා සමවන ජ්‍යොතිෂ් ශාස්ත්‍රය අසහාය මානව චින්තනයේ හාස්කමින් ප්‍රභවය වූවකි. එය ඉපැරණි වේද ශාස්ත්‍රයේ ප්‍රමුඛාංගයකි.

**''ශික්ෂා කල්පෝ ව්‍යාකරණං - නිරුක්තිං ඡන්දසාඤ්චයත්**

**ජ්‍යොතිෂාගමනං චෛව - වේදාංගානි ෂඩේතුවත්''** (*කාව්‍යමාලා* - i /91)

තත් ශාස්ත්‍රානුකූලව ලොව පහළවන ජන්මියෙකුගේ ජන්මලාභ මොහොතෙහි විශ්වයේ දිදුලන ග්‍රහතාරකාවන්ගේ ගතිලක්ෂණ අනුසාරයෙන් පුද්ගලයා විශ්වය හා තදනුබද්ධව ක්‍රියාත්මක කරවන ක්‍රියාවලිය ඉතා පැහැදිලිව විෂද කෙරේ. ඒ අනුව ඍෂි ඇස බලගැන්වීමෙන් ප්‍රභවයලත් ජ්‍යෝතිර් විද්‍යාත්මක න්‍යායයන් සිද්ධාන්ත, හෝරා සහ සංහිතා යන ත්‍රිවිධ ක්‍රමෝපායයන්ගෙන් අපට හඳුනාගත හැකි ය. එහිදී පරාසර, ගර්ස, නන්දිකේෂාදී මහඍෂීන්ගේ පරීක්ෂාවනට අනුව ග්‍රහමණ්ඩලයේ පවතින ගුරු සහ බුධ ග්‍රහද්වය නෛසර්ගික ශුභයෝ වෙති. සුරගුරු, ත්‍රිදිවේෂ, ජීව, අංගීරස, වාගීශ, වාචාංපති, ප්‍රශාන්ත, ආර්යයාදී පර්යාය නාමයන්ගෙන් බුහුමනට පාත්‍රවන ගුරු ග්‍රහයා නුවණට අධිපති ලෙස ද, චන්ද්‍රපුත්‍ර, ශාන්ති, බෝධන, විතඥ, විධුසුත, කුමාර, ක්ෂ්‍යාමගාත්‍රාදී නාමයන්ගෙන් හැඳින්වෙන බුධ ග්‍රහයා ප්‍රධාන වශයෙන් බුද්ධියට අධිපති ලෙස ද පෙන්වා දී ඇත.

යථෝක්ත මතයට අනුව පුද්ගලබද්ධ ජන්මපත්‍රයක ගුරු සහ බුධ සංයෝගය ප්‍රබලවීම ජන්මියාව වියත් මහාප්‍රාඥ බවකට මෙන්ම එකී ග්‍රහයන් දුබලවීම ජන්මියාව දුශ්ප්‍රාඥ බවකටත් පමුණුවන බව පෙනේ. තවද ගුරු හා බුධ ප්‍රබලව පිහිටා තිබීම පුද්ගලයා වෙත පැමිණෙන කෝටියක් දෝශයන් හංගකර ජීවිතය විශ්මිත ප්‍රබලත්වයකට පත්කරවනු පෙනේ. තෝරාගත් නියැදී කිහිපයක් ආශ්‍රයෙන් මෙය ප්‍රත්‍යක්ෂ කොට දැක්වීම මෙහිදී සිදු කෙරේ.

**ප්‍රමුඛ පදඃ ජන්මපත්‍රය, සංයෝග, කාරකත්ව, ග්‍රහදෘෂ්ටි, ගණ්ඩාන්ත, නෛසර්ගික**